අද
කාණ්ඩය 006 | පත්‍රය 232
CITY
2017-11-22
බදාදා
මිල රු. 20/-

# ඡන්ද අයිතිය අතුගා දැමීමට දේශපාලන හස්තයක්?

## මැතිවරණ නිරීක්ෂණ සංවිධාන

**එච්.අයි. තුෂාර**

පළාත් පාලන ආයතන මැතිවරණය කල්දමා ඡන්දදායකයන් මිලියන 15කගේ ඡන්ද අයිතිය අතුගා දැමීම සඳහා මේ වනවිට දේශපාලන හස්තයක් ක්‍රියාත්මක වෙමින් තිබෙන බව මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සඳහන් කරයි.

රට ගැන නොසිතා තමන්ගේ පක්ෂය ගැන සිතා කටයුතු කරන දේශපාලනික කණ්ඩායමක් විසින් මැතිවරණය කල්දැමීම සඳහා කුමන්ත්‍රණයක් දියත් කර තිබෙන බවත්, ඉදිරියේදී මෙම කණ්ඩායම් හෙළිකිරීමට කටයුතු කරන බවත් එම සංවිධාන නියෝජිතයෝ පැවසූහ.

මැතිවරණ නිරීක්ෂණ සංවිධාන විසින් ඊයේ (21දා) පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදී මේ බව අවධාරණය කෙරිණි.

එහිදී අදහස් දැක්වූ පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේ, මැතිවරණය කල්දැමීමට උත්සාහ කරන දේශපාලඥයන්ට ඡන්ද අයිතිය උපයෝගී කරගෙන ජනතාව පාඩම් ඉගැන්විය යුතු බවයි.

පොදුවේ වසර දෙකහමාරක සිට පළාත් පාලන ආයතන මැතිවරණය කල්යමින් තිබෙන බවත්, මඩකලපුව ප්‍රදේශයේ පළාත් පාලන ආයතන දෙකෙහි නිල කාලය 2008 වසරේදී අවසන් වීමට තිබෙන බවත් හෙතෙම පවසා සිටියේය.

මේ අනුව එම පළාත් පාලන ආයතන දෙකට වසර 09කට වැඩි කාලයක සිට නියෝජිතයන් නොමැති බවද ඔහු සඳහන් කළේය.

මෙවැනි තත්ත්වයක් තුළ කඩිනමින් පළාත් පාලන ආයතන මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරමින් තිබියදී, එය කඩාකප්පල් කිරීමට දේශපාලන කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම මිලියන 15කගේ ඡන්ද අයිතිය අතුගා දැමීමක් බවද විධායක අධ්‍යක්ෂවරයා පවසා සිටියේය.